**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**
**පාසල් මට්ටම**

**9 ශ්‍රේණිය** **සාහිත්‍ය දැනුම මිනුම**
**කාලය පැය 01.30 යි.**

**(1)පෙළ පොත ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.** (ලකුණු 15)

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද | කා යට කියන ලද්දක් ද |
|---|---|---|---|
| 1 ඔබේ මිහිරි ගීත රාවයෙන් මරණය මා වෙතින් පලා ගියා | | | |
| 2 මං දන්නව තොපි දෙන්න ම ඇවිත් තියෙන්නෙ ලොකු අංචියක් අදින්න බව | | | |

(2) පහත සඳහන් කවියෙහි ඉතිරි පද සම්පූර්ණ කරන්න. (ලකුණු 10)

අත් වැඩ පර වැඩ සම ව සිතන්නේ

.......................................................................

.......................................................................

සෙත් පුර සැප කෙලෙසක ද ලබන්නේ

(3) පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරන්න. (ලකුණු 15)

මං සදන්නන් ගල කඩන තැන

බිම් කොටන්නන් සරණ වැඩ බිම

දූලි තැවරුණු සළුදරා ගෙන

අව්වේ වස්සේ සිටිති දෙවියෝ

1 මෙසේ වැඩ කරන ජනතාව අතර දෙවියන් වැඩ වසන බව පැවසුවේ කවුද?

(එස් මහින්ද හිමි , රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ,එදිරිවීර සරච්චන්ද්‍ර මහතා)

2 'කව්මිණ' ළමා කාව්‍ය රචනා කළේ කවුද?

( කුමාරතුංග මුනිදාස මහතා , එස් මහින්ද හිමි , ඩී පී වික්‍රමසිංහ මහතා)

3 'මල් මල් වාරම් හරිමැ උදාරම්' ගීතය රචනා කළේ කවුද?

(බැලිස්ටස් ජයසිංහ මහතා , සුනිල් සරත් පෙරේරා මහතා , මහගමසේකර මහතා)

(4) පහත සඳහන් වාක්‍ය හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද කොටුව තුළ යොදන්න. (ලකුණු 15)

1 පෙබරවාරි 20 ජාතික නර්තන දිනයයි .

2 මග දිගට ජන කතා කෘතිය ඩී පී වික්‍රමසිංහ මහතාගේ ය.

3 දේශීය නර්තනයේ රන් සළකුණ රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ය.

(5) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි කරන්න. (ලකුණු 15)

1 ශක්‍යතාව 2 දේශානුරාගය 3 බහුශ්‍රැතයෝ 4 අනුප්‍රාසය 5 ශ්‍රැති ගෝචර ශෛලිය

මෙම පද්‍ය කණ්ඩයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි-බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි

(6) මෙම පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 10)

ලක් වැසියන් කෙරෙහි නැමී

උරහත් මහ මිහිඳු හිමී

පෙව්වෙ උතුම් සඳහම් මී

පුත නුඹටත් පොවමි එ මී

1 මිහිඳු හිමී ලක් වැසියන්ට පෙව්වේ මොනවා ද ?

2 එ මී යන්නෙහි අරුත කුමක් ද ?

3 මෙහි සඳහන් රූපකයක් ලියන්න.

(7) පහත සඳහන් ගීතය කියවා ඔබට සිතෙන අදහස් වචන පනහකින් පමණ ලියන්න. (ලකුණු 20)

මේ රට මගෙ රට

මා ඉපදුන රට

හැදෙන වැඩෙන රට

මගේ ම මව් රට

සරු පස පොළොවෙන් - වැහි බිඳු අහසෙන්

මිණි කැට මුතු ඇට - මගෙ සිරි ලක ඇත

මගෙ සිරි ලක ගැන

ලොවට කියමි මම

සුර පුරයක් වෙන - ලොවේ මෙවැනි නැත

එඩිතරකම ඇති

කම්මැලිකම නැති

ළමයින් සිටින රට

මගෙ මේ සිරි ලක